# ලෝක සාම දශකය වෙනුවෙන් කළුතර දිසාවටත් නායකත්වය ලබාදීම අපේ අරමුණක්

**- හාතියල්වල චන්ද්‍රානන්ද හිමි**


හොරණ සමූහ බන්දුල ආර්. ගුලවත්ත
බලුත්සිංහල සමූහ ජී. කරුණාරත්න


සමස්ත ලෝකවාසී ජනතාව තුළ සාමය උදාකර ගැනීමේ අවශ්‍යතාවක් ගොඩනැගී තිබෙන හෙයින් සාමය සමගිය සමාදානය පුළුල් කිරීමටත් එක්සත් ජාතීන්ගේ සංවිධානයත් සමග ලෝක සාම දශකය දියත් කිරීමේ වැඩපිළිවෙළ උදෙසා කළුතර දිස්ත්‍රික්කය තුළට නායකත්වය ලබාදීම මේ ව්‍යාපාරයේ අරමුණ යැයි මදුරාවල අම්පිටියාගල ශ්‍රී සුමංගලාරාමාධිපති හාතියල්වල චන්දනන්ද නාහිමිපාණෝ පැවසූහ.

එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා මිත්‍රත්ව සංවිධානයේ මදුරාවල ශාඛාවේ මෙහෙයවීමෙන් මදුරාවල මහා විදුහලේ පැවැති ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනෙහි මුලසුන් දරමින් හාතියල්වල චන්දනන්ද නාහිමිපාණෝ මෙසේ ද පැවසූහ.

ජාතික ආගමික සහ සමාජීය වශයෙන් ගමේ පළාතේ සංවර්ධනය උදෙසා ජාතික එකමුතුවක් ගොඩනැගීම අපේ අභිප්‍රායයක්. ජාතීන් අතර සමගිය ආර්ථික අධ්‍යාපනික දියුණුව තුළින් අප ජාතියේත් අන්‍ය ජාතීන් අතරත් අන්‍යෝන්‍ය සහයෝගිතාවය වර්ධනය කිරීම මේ මිත්‍රත්ව සංවිධානයේ පොදු අරමුණක්. මදුරාවල ශාඛාව දියත් කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා ජනතාවගේ පුළුල් අවධානය සහ සහයෝගය අපට අත්‍යාවශ්‍ය වෙනවා.

එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් දේශප්‍රිය විජේතුංග මහතා

21 වන සියවස ආරම්භයේදීම 2000 ආරම්භවන දශකය සාම දශකය වශයෙන් නම් කළා. ඒ පළමු වසර සාමයට හිතැති වැදගත් කාර්යයන් රාශියක් ආරම්භ කළා. එහි පළමුවන අංකය වූයේ ලෝකයේ සිටින සියලු නෝබල් ත්‍යාගලාභීන් 7 ප්‍රංශයේ අයිෆල් කුළුණ ළඟට කැඳවා ලෝකයටම ගැළපෙන සාම ප්‍රඥප්තියක් සකස් කළා. රාජ්‍ය නායකයන් ආගමික නායකයන් ඒ ප්‍රඥප්තිය පළමුවරට අත්සන් කළා. ඉන්පසු මෙම ප්‍රඥප්තිය ලෝක ජනතාවට යොමුකළා. ඒ ප්‍රඥප්තිය අද එක්සත් ජාතීන්ගේ වෙබ් අඩවියක තැන්පත්කැර තිබෙනවා. අවුරුදු දහසකින් උදාවන ඊළඟ සහස්‍රකයේදී හෝ ලබාගත හැකි ආකාරයට සුරක්ෂිතකැර තිබෙනවා. දෙදහේ වසර තුළ ලෝකයේ රටවල් අතර යුද්ධ 54 ක් සිද්ධවුණා. මෙහිදී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සංවිධානය මේගැන යළිත් අවධානය යොමුකළා. ආරක්ෂක සංවිධානයට අයත් රාජ්‍ය නායකයන් 188 දෙනෙක් සිටිනවා. ඒ අය තීරණයකළා 2001 සිට 2010 දක්වා සාම දශකය ලෙස හැඳින්වීමට. මේ දශකය සාම සංස්කෘතියක් සඳහා උදාවන සාම දශකයක් ලෙස ප්‍රචලිත වෙනවා. ඒ අනුව ලෝකයේ රටවල් ගණනාවක පැවැත්වෙන සම්මන්ත්‍රණ මාලාවක එක් අංගයක් ඒ දැනුම ගමට ගෙනයාම. ඒ අනුව මදුරාවල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට ලැබුණු අනගි අවස්ථාවයි අද මෙහි පැවැත්වෙන්නේ. හාතියල්වල චන්දනන්ද හිමිපාණන්ගේ ඇප කැප වීම මතයි මෙම වැඩමුළුව අද මේ බල ප්‍රදේශය තුළ පැවැත්වෙන්නේ.

ලංකාවටම ලැබී තිබෙන්නේ අවස්ථා දෙකක් පමණයි. මෙහිදී අප බලාපොරොත්තුවන්නේ සම්මන්ත්‍රණ පැවැත්වීමට වඩා ජනතාවගෙන් අදහස් විමසමින් සංවාදයක් ගොඩනැගීම. එක්සත් ජාතීන්ගේ සංවිධානය කියන්නේ ලෝකයේ රටවල් 189 ක් සම්බන්ධ ප්‍රබල සන්ධානයක්. මේ තුළ ජාතික, ආගමික, වාර්ගික සහ වර්ණ භේද නැහැ. තුන්වන ලෝක සංග්‍රාමයක් ඇතිවුවහොත් දැනට ගබඩා කරඇති අවි ප්‍රමාණයෙන් එක්තරා කොටසක් පාවිච්චි කළහොත් දැනට ලෝකයේ ජීවත්වන මුළු ජීවීන් ප්‍රමාණයම විනාශවන්නට පුළුවන්. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලික අරමුණ වූයේ නැවත තුන්වන ලෝක යුද්ධයක් ඇතිවීම වළක්වා ගැනීම. මේ අනුව මේ වැඩසටහන තුළින් අප බලාපොරොත්තුවන්නේ පුද්ගලයා තුළින් ආරම්භවන සාමයේ බීජය පවුල ගම පාසල වැඩපල රට කලාපය හරහා මුළු ලෝකයටම ව්‍යාප්ත කිරීමයි. යුද්ධයක් ආරම්භවන්නේ එක්තරා පුද්ගලයෙකුගේ හිතෙන් ගොඩනැගෙන පහත් චේතනාවක් තුළින් බව අප අමතක නොකළ යුතුයි.

සාමය පිළිබඳ පරමාදර්ශයක් ලෝක ජනතාව තුළ ගොඩනැගීමයි අපේ වැදගත් අරමුණවන්නේ. ඒ සඳහා සාම ආකල්පයන් පිරුණු මානසිකත්වයක් ගොඩනැගිය යුතුවෙනවා.

හිටපු නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ පී. ඩී. විජේමාන්න මහතා. ඈත අතීතයේ පටන්ම අනර්ථකාරී දේවල් මේ සමාජ තලය තුළ සිදුවුණා. අප ළඟ ඉන්න අය සමග සහෝදරත්වයෙන් සිටීමට පුළුවන් නම් සාමය ගොඩනැගීම ඉතාම පහසුයි. මේ සඳහා බෞද්ධ දර්ශනයෙන් ලබාගතහැකි අවබෝධය ඉතා වැදගත්.

බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් පී. ඩී. ජයනෙත්ති මහතා බල අරගල විවිධ අරගල මුලු ලෝකය පුරාම පවතිනවා. රයිගම් කෝරලවාසී ජනතාවගෙන්, සාමකාමී සමාජයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය අදහස් අප මෙහිදී ගොනුකර ගන්නවා.

එම අදහස් අපි එක්සත් ජාතීන්ගෝ සංවිධානය වෙත යොමුකරනවා.

මදුරාවල හිටපු ප්‍රාදේශීය ලේකම් ලයනල් පෙරේරා මදුරාවල මහා විදුහලේ විදුහල්පති බී. කේ. ඩී. ඊ කුලසේකර මහත්වරු ප්‍රමුඛ සම්භාවනීය අමුත්තන් රාශියක් මේ අවස්ථාවට සහභාගි වූහ. වැඩමුළුවට සහභාගිවූ කණ්ඩායම් මගින් ලෝක සාමය පිළිබඳ සංවාදයන් ගොඩනැගීමක් ද සිදුවිය.